**මාධ්‍ය නිවේදනය**

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2022.06.15 |

# ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 මැයි

## 2022 මැයි මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුබෑමක් පෙන්නුම් කරන ලදී.

**2022 මැයි මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 50.3ක අගයක් වාර්තා කළ අතර, එය සෑම වසරකම අඩු අගයක් වාර්තා කරන අප්‍රේල් මාසයේ දර්ශක අගයට සාපේක්ෂව දර්ශකාංක 13.9ක වැඩි වීමකි.** නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකයේ මෙම සුළු ඉහළ යාම සඳහා සේවා නියුක්තියේ යථා තත්ත්වයට පත්වීම සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය. සාමාන්‍යයෙන් ඇනවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩිවීම තුළින් ආර්ථිකයේ නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පිළිබිඹු කරන නමුදු, මෙම අවස්ථාවේදී මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ආනයනික භාණ්ඩ වරායෙන් නිදහස් කරගැනීමේ ප්‍රමාදයන් හා ඉන්ධන හිගය වැනි සැපයුම් අංශයේ අවහිරතාවන්ය. මේ අතර, සේවා නියුක්තිය මෙම මාසයේ දී ඉහළ ගිය අතර විශේෂයෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශය මේ සඳහා දායක විය. තවද, කර්මාන්ත අතර සේවක සංචලනය ද සේවා නියුක්තියේ මෙම වැඩි වීමට යම් දායකත්වයක් සැපයීය.

2022 මැයි මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම්වල පසුබෑම පිළිබිඹු කරමින් නව ඇණවුම්, නිෂ්පාදන සහ තොග මිලදී ගැනීම් පෙර මාසයට සාපේක්ෂව අඩු අගයක පැවතුණි. නිෂ්පාදන සහ නව ඇණවුම්හි දක්නට ලැබුණු පසුබෑම කෙරෙහි ආහාර පාන වර්ග නිෂ්පාදන අංශයේ පසුබෑම විශේෂයෙන් හේතු විය. නව ඇණවුම් අඩු වීම කෙරෙහි උත්සව සමය අවසන් වීමද බලපාන ලදි. තවද, ඉහළ උද්ධමනය සමග මිලදී ගැනීමේ හැකියාව පිරිහීම සහ ආර්ථිකය පිළිබඳ පවතින දිගුකාලීන අවිනිශ්චිතතාව හේතුවෙන් පාරිභෝගික වියදම් කල්පනාකාරීව හැසිරවීම, විශේෂයෙන් අත්‍යවශ්‍යය නොවන භාණ්ඩ සඳහා වන ඉල්ලුම අඩු වීම සඳහා හේතු වූ බව ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. අමු ද්‍රව්‍ය හිඟය සහ පවතින විදුලි කප්පාදුව ඇතුළු නොයෙකුත් සැපයුම් අංශයේ බාධාවන් ද කර්මාන්ත අංශයේ නිෂ්පාදන ක්‍රියාවලියට ඉතා අහිතකර ලෙස බලපාන ලදී. එමෙන්ම, දේශීය වෙළඳපොළ තුළින් අවශ්‍ය ප්‍රමාණයට අමු ද්‍රව්‍ය මිලදී ගැනීමට නොහැකි වීම සහ අමුද්‍රව්‍ය ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීමේ දුෂ්කරතා හේතුවෙන් තොග මිලදී ගැනුම් පහළ යන ලදී. මේ නිසා, බොහෝ නිෂ්පාදකයින්ට ඔවුන්ගේ නිෂ්පාදන සැලකිය යුතු ලෙස පහත දැමීමට සිදුවිය.

| විචලයය | අප්‍රේ. | මැයි. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **36.4** | **50.3** | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 32.0 | 47.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 19.0 | 44.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 43.4 | 51.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 28.0 | 49.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 70.6 | 71.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


රට තුළ පවතින අවිනිශ්චිත තත්ත්වය හේතුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන්, පෙර මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**50.3**

**2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 13.9 ක ඉහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1කින් ඉහළ යමින් 2022 මැයි මාසයේ දී 52.4ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 මැයි මාසයේ දී සිංගප්පූරුව සහ රුසියාව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ද යුරෝපා කලාපය, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, චීනයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව මැයි මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 ජූනි 13 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**අඛණ්ඩව දෙවන මාසයටත් සේවා ක්‍රියාකාරකම්වල පසුබෑමක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 මැයි මාසයේ දී 42.4ක දර්ශක අගයක් දක්වා සුළු වශයෙන් පහත වැටුණි.** මේ සඳහා හේතු වූයේ නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල පහළ යෑමයි.

ප්‍රධාන වශයෙන්, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා, තොග හා සිල්ලර වෙළඳාම, දේපළ වෙළඳාම සහ අධ්‍යාපන යන උප අංශවල දක්නට ලැබුණු පහළ යෑම් සමඟ, 2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2022 මැයි මාසයේ දී නව ව්‍යාපාර තවදුරටත් පහත වැටුණි.

මැයි මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්වල දක්නට ලැබුණු පසුබෑම සඳහා ප්‍රධාන වශයෙන් අඛණ්ඩ විදුලි කප්පාදුව සහ බලශක්ති හිඟය ඇතුළු සැපයුම් සම්බන්ධව පවතින දුෂ්කරතා හේතු විය. මීට අමතරව, මිල ගණන් ඉහළ යෑම සහ රට තුළ පවතින අවිනිශ්චිතතා හේතුවෙන් ඉල්ලුම අඩු වීම ද ව්‍යාපාර ක්‍රියාකාරකම් පහත වැටීමට හේතු විය. මේ අතර, මාසය ආරම්භයේ ඇති වූ සිවිල් නොසන්සුන්තා ද ව්‍යාපාර ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. ඒ අනුව, තොග හා සිල්ලර වෙළෙඳාම, අනෙකුත් පෞද්ගලික සේවා සහ ප්‍රවාහන යන උප අංශවල විශාල පසුබෑමක් මැයි මාසය තුළ වාර්තා විය. මීට අමතරව, සංචාරක පැමිණීම් අඛණ්ඩව පහත වැටීම හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට ද බලපෑම් එල්ල විය.

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල පහත වැටීමට සමගාමීව සේවා අත්හිටුවීම්, විශ්‍රාම යෑම් සහ සේවයෙන් ඉවත්වීම් හේතුවෙන් මැයි මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව පහත වැටුණි. මේ අතර, විදුලි කප්පාදුව, සැපයුම් හිඟය සහ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් තවදුරටත් ඉහළ ගියේය.

| විචල්‍යය | අප්‍රේ. | මැයි. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **43.8** | **42.4** | **-** | **වැඩි වේගයකින් පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 41.5 | 45.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 40.5 | 39.0 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 49.5 | 38.5 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 52.8 | 51.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 34.7 | 37.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් මැයි මාසයේ දී තවදුරටත් පහත වැටුණු අතර, සැපයුම් සම්බන්ධව පවතින දුෂ්කරතා, උද්ධමන පීඩනය සහ රටෙහි පවතින ආර්ථික හා දේශපාලන අවිනිශ්චිතතා මේ සඳහා හේතු විය. තවද, සමහර ප්‍රතිචාර දක්වන්නන් පොලී අනුපාත සහ බදු ඉහළ නැංවීම පිළිබඳව ද කනස්සල්ල පළ කළ අතර, ඇතැමුන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පවත්වන සාකච්ඡාවල සහ විනිමය අනුපාත ස්ථායීකරණයේ ප්‍රගතීන් පිළිබඳව සුබවාදී අදහස් පළ කළහ.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**42.4**

**2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.4ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 මැයි මාසයේ දී 2022 අප්‍රේල් මාසයේ පැවති 52.2 අගයේම නොවෙනස්ව පැවතුනි.

ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, එක්සත් රාජධානිය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 මැයි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, චීනයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2022 ජූනි 13 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.